# නුවරකලාවිය ජනයා අතර ඇති කම්බිලි දේව ඇදහිල්ල (ගල්කිරියාගම ග්‍රාමයේ ජනප්‍රවාද ඇසුරෙන්)

දේශානි එම්.කේ.එස්.[1], හේරත් එම්.කේ.එස්.[2] සහ පුෂ්පකුමාර ටී.එම්.එම්.[3]

[1]අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]ඉංග්‍රීසි අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
sandunideshani2000@gmail.com

**සාරසංක්ෂේපය**

කම්බිලි දේව සංකල්පය කෙතරම් දුරට නුවරකලාවියේ ජන ජීවිතය හා බද්ධ වී තිබේ ද යන්න පර්යේෂණ ගැටලුවයි. සම්මුඛ සාකච්ඡා පර්යේෂණ ක්‍රමවේදයයි. නුවරකලාවියේ ජනතාවවේ කරදරකාරී අවස්ථාවලදී කම්බිලි දෙවියන් පිහිට වන බව විශ්වාසයේ පවතී. කම්බිලියක් පොරවාගෙන ප්‍රදේශය පුරා සැරිසරන කළු කම්බිලි, සැඩ කම්බිලි, රත්න කම්බිලි නම් මෙම දෙවි තුන් කට්ටුව නුවරකලාවිය ප්‍රදේශවල අධිපතිත්වය දරයි. මෙම ප්‍රදේශයේ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැනයි. ගොවිතැන් කටයුතුවලදී හා වෙනත් කුමන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර කහ දියෙන් නාවා ගත් පඬුරක් කම්බිලි දෙවියන් වෙනුවෙන් වෙන් කොට කම්බිලි දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගනී. විශේෂයෙන් වනාන්තර බහුල කලාපයක් වන මෙම කලාපයේ ජනයා විවිධ කාර්යයන් සඳහා කැලයට ඇතුළු වීමේ දී කම්බිලි දෙවියන් උදෙසා කොළ අතු කැබැල්ලක් කඩා ගසක එල්ලා යාම මඟින් කිසිඳු අතුරු අන්තරාවකින් තොරව තම කාර්යය සිදු කරගත හැකි බව තරයේ පිළිගනී. එපමණක් නොව වසංගත රෝග පැතිරෙන්නා වූ අවස්ථාවන්හි දී මෙන්ම උමතු රෝග සුව කර ගැනීම සඳහා කම්බිලි දෙවියන් හට පුදපූජා පැවැත්වීමෙන් සහනයක් ලබා ගත හැකි බව විශ්වාස කරනු ලබයි. විශේෂයෙන් ම ගල්කිරියාගම ප්‍රදේශය ආශ්‍රිතව ඇති නාමල් උයනෙහි ආරක්ෂාව සපයනුයේ කම්බිලි දෙවියන් බවත් කම්බිලි දෙවියන් උදෙසා නාමල් උයනෙහි දෙවොලක් ද පවති. නියඟ වැනි ස්වභාවික ආපදාවන්හිදී නාමල් සෑය කිරියෙන් නහවා කම්බිලි දෙවියන්ගේ පිළිරුවට මල්මාලා පළඳවා දේවාශිර්වාදය ප්‍රාර්තනා කරයි. කම්බිලි දෙවියන් උදෙසා වන බාර ඔප්පු කිරීමේ දී කිරි ඉතිරවීම, පූජා වට්ටි පිළිගැන්වීම හා වාර්ෂිකව පවත්වන බත් මාලාව පිළිගැන්වීම සිදු කරයි. නුවරකලාවිය ආශ්‍රිතව ස්වභාවික වනාන්තර ආගමික ස්ථානයන් ආරක්ෂා කිරීම කම්බිලි දෙවියන් විසින් සිදු කරන බව මෙම ප්‍රදේශයන්හි ජනයා පිළිගනු ලබයි. වර්තමානය වන විට ද කම්බිලි දේව සංකල්පය නුවරකලාවියේ ජනයා විසින් තම දුක් ගැනවිලි, කෘෂිකාර්මික කටයුතු සඳහා පිහිටක් බලාපොරොත්තුවෙන් අදහනු ලබන බවට නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** *කම්බිලි දෙවියන්, ගොවිතැන, නුවරකලාවිය*